# පළාත් හා පළාත් අරමුදල් පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුව

ඌව පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

2018.09.17 දින

ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

# විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක වීම

- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධාන
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රධාන ලේකම්තුමාගේ චක්‍රලේඛ උපදෙස් හා විධිවිධාන
- උසස් අධ්‍යාපන ගරු අමාත්‍යතුමාගේ උපදෙස් හා නියෝග
- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් හා මගපෙන්වීම්

# විගණන හා කළමනාකරණ කමිටුවල සාකච්ඡා කල කරුණු

**01.** අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර ගැනීම සහ අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳව අනුමැතිය ලබාදීම.

**02.** සේවක මණ්ඩල කළමනාකරණ සහ කාර්ය සාධනය පිළිබඳ සාකච්ඡා කිරීම.

**03.** මූල්‍ය පාලනය, මූල්‍ය වාර්තා සහ ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම.

**04.** වත්කම් ආරක්ෂාව සහ වත්කම් පරිපාලනය සහ වාර්තා කිරීම.

**05.** ආයතන අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලසුම් මෙන්ම එහි ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම.

# විගණන කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම

- පිහිටුවා ඇති විගණන කමිටු සංඛ්‍යාව - 80

පසුගිය වර්ෂ 03 සිට මේ දක්වා විගණන කමිටු ක්‍රියාත්මක වීම

| වර්ෂය | පවත්වා ඇති කමිටු සංඛ්‍යාව |
|---|---|
| 2015 | 115 |
| 2016 | 130 |
| 2017 | 157 |
| 2018.09.13 දින දක්වා | 106 |

# පළාත් හා පළාත් අරමුදල් පිළිබඳ කමිටු කටයුතු

2017.12.27 දින ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, සහකාර විගණකාධිපති (ඌව), විගණන අධිකාරීවරුන්ගේ (බදුල්ල/ මොණරාගල) සහභාගීත්වයෙන් පළාත් අරමුදල් පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී.






SRI LANKA


SRI LANKA


SRI LANKA

## සාකච්ඡා කල කරුණු

**01.** පළාත් අරමුදල ශක්තිමත් කර ගැනීම සඳහා මූල්‍ය පාලනය, අයවැය පාලනය හා පිරිවැය පාලනය සම්බන්ධ කටයුතු කිරීම.

**02.** නව සහශ්‍ර සංකල්ප මෙන්ම ජාතික හා පළාත් ප්‍රතිපත්ති වලට සමගාමීව ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම හා කාර්ය සාධනය පවත්වාගෙන යාම.

**03.** පළාත් මුදල් රීති, මුදල් රෙගුලාසි, වෙනත් නීතිරීති වල අනුගත වෙමින් විගණන කටයුතු සඳහා ඵලදායී ආකාරයෙන් සහය ලබාදෙමින් මූල්‍ය විචක්ෂණතාවය පවත්වා ගැනීම.

# රාජ්‍ය ගිණුම් කාරක සභා මට්ටමේ සහ රාජ්‍ය විගණනයේ ඇගයීම

**පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ ඇගයීමට ලක්වීම මූල්‍ය විචක්ෂණතාවයකින් කටයුතු කිරීමට සාක්ෂියකි.**

| ආයතනයන් | | 2016 | 2017 |
|---|---|---|---|
| | | සම්මාන කුසලතා | සම්මාන කුසලතා |
| ඌව පළාතේ ප්‍රධාන ලේකම් යටතේ පවතින ආයතන | මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව | ✓ | - |
| | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය | - | ✓ |
| | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය | - | ✓ |
| | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | ✓ | ✓ |
| ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය | ප්‍රාදේශීය සභාව මැදගම | ✓ | - |
| | ප්‍රාදේශීය සභාව හපුතලේ | ✓ | ✓ |
| | ප්‍රාදේශීය සභාව මොණරාගල | - | ✓ |
| | ප්‍රාදේශීය සභාව ඇල්ල | - | ✓ |

| ආයතනයන් | | 2016 සම්මාන කුසලතා | 2017 සම්මාන කුසලතා |
|---|---|---|---|
| ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය | ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | ✓ | - |
| | පරිවාස දෙපාර්තමේන්තුව | - | ✓ |
| | සමාජ සේවා දෙපාර්තමේන්තුව | ✓ | ✓ |
| මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමූපකාර කටයුතු අමාත්‍යාංශය | ඌව පළාත් මාර්ග අමාත්‍යාංශය | - | ✓ |
| | සමූපකාර දෙපාර්තමේන්තුව | - | ✓ |
| ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිශ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ✓ | ✓ |

# අභ්‍යන්තර විගණන කටයුතු

<u>අභ්‍යන්තර විගණනයේ ක්‍රියාත්මක වීම</u>

- **ඌව පළාතේ ප්‍රධාන ලේකම්තුමන්ගේ සෘජු අධීක්ෂණය මත වාර්ෂික විගණන වැඩ සැලැස්මකට අනුමැතිය ලබාදීම.**
- **පළාත් මුදල් රීති 133 හි සඳහන් විධිවිධාන අනුගමනය කිරීම.**
- **ආයතන මට්ටමින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු සාකච්ඡා වලට අනුකූලව කටයුතු සිදු කිරීම.**
- **ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමන්ගේ අනුමැතිය මත ගරු ආණ්ඩුකාරතුමන් සහ ලේකම්වරුන්ගේ ඉල්ලීම මත විශේෂ පරීක්ෂණ පැවැත්වීම.**
- **විගණකාධිපති වාර්තා, විගණන විමසුම් මගින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු නොවූ බවට පෙන්වා දෙන ආයතන සම්බන්ධව අවධානය යොමු කිරීම.**

# විගණකාධිපති වාර්තා

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | UV/BD/B/UPC/03/13/<br>2014/86 | |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | |
| දිනය<br>திகதி<br>Date | 2015 පෙබරවාරි 10 දින. | |

04 MAR 2015

ආණ්ඩුකාරතුමා
ඌව පළාත.

ඌව පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1987 අංක 42 දරන පළාත් සභාපනතේ 23(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

ඌව පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**විගණකාධිපති වාර්තාව 2013**

7.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය තුලදී පහත සඳහන් ආයතනවල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

(අ) ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඊට අයත් ආයතන 06 ක,

(ආ) ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයුර්වේද රෝහල් 06 ක, මධ්‍යම බෙහෙත් ශාලා 19 ක හා ඔසු උයන් 01 ක,

(ඇ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ආයතන 04 ක,

(ඇ) ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින මූලික රෝහල් 05 ක, දිස්ත්‍රික් රෝහල් 54 ක, මධ්‍යම බෙහෙත් ශාලා 27 ක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 18 ක,

(ඉ) ඌව පළාත තුළ පිහිටි පළාත් පාලන මණ්ඩල,

7.4 විගණන හා කළමනාකරණ කමිටු

පළාත් සභාවේ මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභාවේ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු හා කාර්යාල 22 ක විගණන හා කළමනාකරණ කමිටු විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } UV/BD/B/UPC/03/14/2015/51

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 2, දින

ආණ්ඩුකාරතුමා
ඌව පළාත් සභාව.

ඌව පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

ඌව පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**විගණකාධිපති වාර්තාව 2014**

7.2 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් ආයතන වල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) ඌව ආණ්ඩුකාරවර කාර්යාලය.
(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
(ඇ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය
(ඈ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය
(ඉ) ඌව පළාත් පාලන ආයතන
(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල
(උ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව.
(ඌ) ආයුර්වේද රෝහල් 06 ක්, මධ්‍යම බෙහෙත් ශාලා 19 ක් සහ ඔසු උයන් 01
(එ) මූලික රෝහල් , දිස්ත්‍රික් රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය.

7.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

පළාත් සභාවේ මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභාවේ දෙපාර්තමේන්තු, කාර්යාල හා පළාත් පාලන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

විගණකාධිපති වාර්තාව 2014

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. UVP/BD/B/UPC/03/15/2016/67

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2016 දෙසැම්බර් 08 දින

ආණ්ඩුකාරතුමා,

ඌව පළාත.

ඌව පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

ඌව පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

7.3 විගණන හා කළමනාකරණ කමිටු

7.3.1 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ඌව පළාතේ පළාත් පාලන ආයතන, කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය, ඌව පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සහ බදුල්ල හා මොනරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල යන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

7.3.2 2015 වර්ෂය තුළදී පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු වලදී ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

7.2 අභ්‍යන්තර විගණනය

7.2.1 පළාත් සභාවට අයත් ආයතන 53 ක් සම්බන්ධයෙන් 2015 වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ආයතන 30 ක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර විගණනයන්ට අදාළ වාර්තා නිකුත් කර නොතිබුණි.

**විගණකාධිපති වාර්තාව 2015**

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } UVP/BD/B/UPC/03/16/2017/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 අගෝස්තු [illegible] දින.

ආණ්ඩුකාරතුමා

ඌව පළාත.

**ඌව පළාත් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

ඌව පළාත් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුළත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

**විගණකාධිපති වාර්තාව 2016**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

28

**අභ්‍යන්තර විගණනය සහ විගණන හා කළමනාකරණ කමිටු**

සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද අභ්‍යන්තර විගණනයන් සහ පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටුවලදී ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පසු පරීක්ෂණ ක්‍රියාත්මක කර නොතිබුණි.

**විගණකාධිපති වාර්තාව 2016**

# පළාත් සභා අරමුදල්

*2018 පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 35*

නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු මාස 6කට වඩා වැඩි කාලයක් රඳවා ගෙන තිබුණි.

## ඌව පළාත් සභාව

**මූල්‍ය නීතිරීති හා කාර්ය සාධනය පිළිබඳ නියමයන් සඳහා අනුගතවීමේ ප්‍රතිශතය - 72.0**

**2016 වර්ෂය සඳහා අදාළ කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව පහත සඳහන් දුර්වලතා හඳුනාගනු ලැබ ඇති අතර, එම දුර්වලතා පිටුදැකීම කෙරෙහි අදාළ ආයතනයේ විශේෂ අවධානය යොමු විය යුතු බව කමිටුව අවධාරණය කරයි.**

පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා ආයතන ආවරණය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා කාලීනව ඉදිරිපත් කර නොතිබුණි. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ගනු ලබන තීරණ ඇතුළත් වාර්තා කාලීනව පළාත් සභාවට ඉදිරිපත් කර නොතිබුණි. පළාත් සභාව සතු ඉඩම් හඳුනාගෙන අරමුදලේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. පළාත් සභාව සතු ගොඩනැගිලි හඳුනාගෙන අරමුදලේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. පළාත් සභාව සතු යන්ත්‍රෝපකරණ හඳුනාගෙන අරමුදලේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. පළාත් සභාව සතු ලීබඩු හා කාර්යාල උපකරණ හඳුනාගෙන අරමුදලේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. පළාත් සභාව සතු වාහන හඳුනාගෙන අරමුදලේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
UVA PROVINCIAL COUNCIL

සමන්ත විද්‍යාරත්න, ඌව පළාත් සභා මන්ත්‍රී,
ජනතා විමුක්ති පෙරමුණ, බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය, අංක 500, මහියංගණය පාර, බදුල්ල.
දුරකථන අංකය - 0552223863. email- samanthaviddyarathna@gmail.com

2018.03.06

ප්‍රධාන ලේකම්තුමා,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
ඌව පළාත් සභාව,
බදුල්ල.

07 MAR 2018

ප්‍රධාන ලේකම්තුමනි,

**විශේෂ පරීක්ෂණයක් සිදුකරදෙන ලෙස ඉල්ලා සිටීම,**

ඌව පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මීගහකිවුල කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානය ඉදිකිරීමේදී එම කර්මාන්තය ඉදිකිරීමට ගිවිසුම් අත්සන් කළ අවස්ථාවේදී ලබාදී ඇති ඇස්තමේන්තුව හා ගෙවීම් සිදු කිරීමේදී සකස් කරන ලද බිල්පත අතරත්, එම කර්මාන්තය සිදු කිරීමේදී කාර්මික නිලධාරී මහතාගේ උපදෙස් මත ඉටු කරන ලද වැඩ කොටස් හා ගෙවීම් සිදු කිරීමේ බිල්පත අතරත් වෙනසක් පවතින බවත්, එසේම ගිවිසුම්ගත ඇස්තමේන්තුවට අමතරව සංශෝධිත ඇස්තමේන්තුවක් සකස්කර ගෙවීම් සිදුකර ඇති බවත් එම කර්මාන්තය සිදුකිරීමට මැදිහත් පාර්ශවයන් විසින් දිගින් දිගටම මාවෙත දන්වා ඔවුන් විසින් සිදුකළ සම්පූර්ණ වැඩ කොටස් වෙනුවෙන් වැයවූ මුදල් ලබාදීමට අවශ්‍ය කටයුතු සලසනමෙන් ඉල්ලීම් කරනු ලබයි.

මේ සම්බන්ධයෙන් පරීක්ෂාකර අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස මා විසින් ඌව පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2017.12.04 දිනැතිව දන්වා ඇතත් මේ දක්වා ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැතිබව මා වෙත නැවතත් අදාල පාර්ශවයන් විසින් දන්වා ඇත.

එබැවින් මේ සම්බන්ධයෙන් සිදුව ඇති සත්‍ය තත්ත්වය සොයා බැලීමට ඌව පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය වෙත යොමුකර එම වාර්තාවේ පිටපතක් මාවෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සලසනමෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබතුමා දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ස්තූතියි,
මෙයට විශ්වාසී,

සමන්ත විද්‍යාරත්න,
ඌව පළාත් සභා මන්ත්‍රී.

සමන්ත විද්‍යාරත්න
ඌව පළාත් සභා මන්ත්‍රී
මහියංගනය පාර,
බදුල්ල

පිටපත:- ආර්.වී.ඩබ්ලිව්.එම්. වීරේරත්න මහතා, - දැන ගැනීම පිණිස.
19 කණුව,
කරමැටිය,
මීගහකිවුල.

ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
UVA PROVINCIAL COUNCIL

සෞඛ්‍ය , දේශීය වෛද්‍ය , පරිවාස හා ළමාරක්ෂක ,වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය
சுகாதார , சுதேச வைத்திய , நன்னடத்தை சிறுவர் பராமரிப்பு மற்றும் மகளிர் விவகார, rKfeyd,Gup mikr,R
Ministry Of Health , Indigenous Medicine , Probation and Child care, Women Affairs and Social Welfare


ආර්.එච්. ගුණවර්ධන මාවත , බදුල්ල.
R.H. Gunawardana Mawatha , Badulla.


මගේ අංකය / எனது இல / My No: 5/AC/FA/.IA/03
ඔබේ අංකය / உமது இல / Your No: ----------------------------
දිනය / திகதி / Date: 2017.12.28

අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
ඌව පළාත් සභාව.

අභ්‍යන්තර විගණන දෙපා... ඌව පළාත් සභාව
11 JAN 2018

**අභ්‍යන්තර විගණන පරීක්ෂණය-2017**
**ගෝඩුන්න ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක : අවි/20/2017/14/248 හා 2017.10.10 දිනැති ලිපිය හා බැඳේ..

02. ඒ අනුව, එම විගණන විමසුමේ සදහන් කරුණු සම්බන්ධයෙන් ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් විසින් මා වෙත යොමු කරන ලද අංක : 16/2/1/2 හා 2017.12.21 දිනැති පිළිතුරු වාර්තාව මේ සමග කාරුණිකව ඉදිරිපත් කරන අතර එහි සදහන් කරනු සම්බන්ධයෙන් විගණනයේ එකගතාවය මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අඩුපාඩු නිවැරදි කිරිම සම්බන්ධයෙන් නැවත පරීක්ෂා කර බැලීමට යෝජනා කරමි.

එල්.එල්.අනිල් විජේසිරි
ලේකම්.

පිටපත: 01.ඌව පළාතේ ප්‍රධාන ලේකම් ,ප්‍රධාන ලේකම් කාර්යාලය. - කාරුණික දැන ගැනීම සදහා
02.ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්,ආණ්ඩුකාරවර කාර්යාලය-කාරුණික දැන ගැනීම සදහා
03.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය), මූල්‍ය කළමනාකරණ කාර්යාලය-කාරුණික දැනගැනීම සදහා
04.සහකාර විගණකාධිපති, සහකාර විගණකාධිපති කාර්යාලය.- කාරුණික දැන ගැනීම සදහා
05.අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,අභ්‍යන්තර දෙපාර්තමේන්තුව- කාරුණික දැන ගැනීම සදහා

# ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය
**ஊவா மாகாண முதலமைச்சர் அலுவலகம்**
**OFFICE OF THE CHIEF MINISTER OF UVA PROVINCE**

ඌව පළාත් සභාව, රජ වීදිය, බදුල්ල
ஊவா மாகாண சபை, இராஜ வீதி, பதுளை.
Uva Provincial Council, King's Street, Badulla.

02 MAY 201

මගේ අංකය - ඌව/ප්‍ර/අමා/01
2018 අප්‍රේල් මස 02 වැනිදා

අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,
අභ්‍යන්තර විගණන කාර්යාලය,
ඌව පළාත් සභාව.

හිතවත් ප්‍රධාන ලේකම්තුමනි,

<u>ආයතනයේ අක්‍රමිකතා දූෂණ හෙළි කිරීම</u>

උක්ත මැයෙන් යුතුව කහගොල්ල පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලයේ අනාගතය සුරැකීමේ සංගමයේ සාමාජිකයින් විසින් එම ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂවරයාගේ අක්‍රමිකතා හා දූෂණ කටයුතු සම්බන්ධව දන්වා සිටිමින් ඌව පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය චාමර සම්පත් දසනායක මැතිතුමන් වෙත යොමු කර ඇති 2018.02.24 දිනැති ලිපිය මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

ඒ අනුව, ලිපියේ සඳහන් කරුණු සම්බන්ධව සුදුසු විමර්ශණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සලස්වන මෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ උපදෙස් පරිදි කාරුණිකව ඉල්ලා සිටිමි.

"ඌවට පැහැබර අනාගතයක් ගොඩනගමු"

ස්තූතියි
මෙයට - හිතවත්

ඒ.බී.එම්.ඩබ්. ජයලත්
ඌව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ
පෞද්ගලික ලේකම්

ඌව පළාත් සභාව
ඌවා மாகாண சபை
Uva Provincial Council

Ministry of Finance & Planning, Law & Peace, Education, Local Government, Land, Power & Energy, Construction and Rural Infrastructure Development

King Street - Badulla

Your No }
My No } 9/වි/ 4/1-111
Date } 2018.03. 21

අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ ,
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
ඌව පළාත් සභාව.

<u>විශේෂ පරීක්ෂනයක් සිදුකරදෙන ලෙස ඉල්ලා සිටීම.</u>

උක්ත කාරණය සම්බන්ධයෙන් මා අමතා ඇති ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අංක 4/AD/AD/09/01/01 හා 2018.03.14 දිනැති ලිපිය හා බැදේ.

අදාල ලිපිය මගින් මීගහකිවුල,කරමැටය,19 කනුව පදිංචි ආර්.ඩී.ඩබ්.එම්.විජේරත්න මහතා විසින් ඌව පළාත් සභා මන්ත්‍රී ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමා වෙත ඉදිරිපත්කර ඇති ලිපියක් මගින් ඔහු විසින් මීගහකිවුල ප්‍රදේශයේ ඉදිකරන ලද කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානය සදහා ලැබිය යුතු මුදල් නියමිත පරිදි ගෙවා නොමැති බව වාර්ථා කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටුකර දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බවත්, සදහන් කරමින් මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් පවත්වා ඒ සම්බන්ධයෙන් වාර්ථාවක් ගරු මන්ත්‍රීතුමා වෙත ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත.

මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් පැනනැගී ඇති කරුණු පරීක්ෂා කිරීමෙන් අනතුරුව මීට අදාල සියළු පාර්ශවයන් කැදවා කිප අවස්ථාවකම සාකච්ඡා කර ගැටළුව විසදීමට උත්සහ කලද මෙම ඉදිකිරීම සිදුකල ආර්.ඩී.ඩබ්.එම්.විජේරත්න මහතා එකගතාවයකට පත් නොවීම තුල ඔහු විසින් විවිධ පාර්ශවයන් වෙත කරුණු ඉදිරිපත් කරමින් ඔහුට සාධාරණයක් ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටී.

එබැවින් අදාල [illegible] මේ සමග ඉදිරිපත් කරන අතර, ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමාගේද ඉල්ලීම පරිදි උක්ත ඉදිකිරීමට අදාලව ඔබ දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්ථාවක් ලබාදෙනමෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පී.ඒ.එම්.එස්.පී.අඹන්වල
ලේකම්

පිටපත - ආර්.ඩී.ඩබ්.එම්.විජේරත්න මහතා -දැ.ගැ.ස

Secretary 055-2222801 | 055-2222820 | Senior Asst. Secretary 055-3012940 | Asst. Secretary (administrative) 055-2231969 | 055-2229686 | 055-2230963 | Accountant 055-2222814 | Fax

"ජනතා හිතවාදී දැඩිමනම පළාත් සභා රාජ්‍ය සේවාවක්"
"மக்கள் நல முதன்மையான மாகாண அரச சேவை"

# ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
## ஊவா மாகாண ஆளுநரின் காரியாலயம்
## OFFICE OF THE GOVERNOR, UVA PROVINCE

රජ වීදිය, බදුල්ල. இராஜ வீதி, பதுளை. King's Street, Badulla.

67

| | | | | | |
|---|---|---|---|---|---|
| ඔබේ අංකය / உமது இல / Your No | | මගේ අංකය / எனது இல / My No | 1/4/2/1-A-I | දිනය / திகதி / Date | 2017.12.14 |

"1818 ඌව වෙල්ලස්ස නිදහස් අරගලයේ 200 වන අභිමානවත් සැමරුමට පෙළ ගැසෙමු"

15 DEC 2017

ඌව පළාතේ ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
ඌව පළාත් සභාව,
බදුල්ල.

**<u>ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ A.B.M විජේතුංග මහතා විසින් රජයේ මුදල් අවභාවිතා කිරීම, විගණන විමසුම්වල නිර්දේශයන්ට පටහැනිව ක්‍රියා කිරීම හා මුදල් රෙගුලාසිවලට පටහැනිව සිදු කළ දූෂණ හා වංචා සම්බන්ධවයි.</u>**

උක්ත මැයෙන් යුතුව ඌව පළාත් කෘෂිකර්ම උපදේශකවරුන්ගේ වෘත්තීය සංගමය විසින් ඔබට ද පිටපත් සහිතව ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන ලද 2017.11.24 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂක ඒ.බී.එම් විජයතුංග මහතා බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා ලෙස සේවය කරන අවස්ථාවේ දී සහ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරන අවස්ථාවේදී එම දෙපාර්තමේන්තුව සතු නිල වාහන අනතුරට ලක්කිරීම සහ අවභාවිතා කිරීම, විධිමත් ටෙන්ඩර් පාටිපාටියෙන් බැහැරව යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සහ එම දෙපාර්තමේන්තු නිලධාරීන් සහ සේවකයින් රාජකාරි කාලය තුළ උද්ඝෝෂණ ව්‍යාපාරවලට සහභාගි කරවා ගැනීම යනාදී කටයුතු කර ඇති බව යථෝක්ත ලිපියෙන් වාර්තා කර ඇත.

03. ඒ අනුව මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන අධ්‍යක්ෂ ලවා විගණනයක් සිදුකළ යුතුව ඇති බව ගරු ආණ්ඩුකාරතුමා විසින් නිරීක්ෂණය කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බලා, එම විගණනයට අවශ්‍ය ඉදිරි කටයුතු කඩිනමින් සලසා ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමට මා වෙත ලබා දෙන මෙන් එතුමාගේ උපදෙස් පරිදි කාරුණිකව ඉල්ලා සිටිමි.

එච්.එම්.සෝමතිලක
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්


| | | | |
|---|---|---|---|
| ගරු ආණ්ඩුකාරතුමා / கௌரவ ஆளுநர் / Hon. Governor | ආණ්ඩුකාරවර ලේකම් / ஆளுநரின் செயலாளர் / Secretary To The Governor | සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Asst. Secretary | පරිපාලන නිලධාරි / Adm. Off. |
| දුරකථන / தொலைபேசி / Telephone: 055-2223123 | දුරකථන / தொலைபேசி / Telephone: 055-2222824 | දුරකථන / தொலைபேசி / Telephone: 055-3567062 | දුරකථන / தொலைபேசி / Telephone: 055-2231056 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax No: 055-2223123 | ෆැක්ස් / பெக்ஸ் / Fax No: 055-2225857 | ෆැක්ස් / பெக்ஸ் / Fax No: 055-2222202 | කාර්යාලය / காரியாலயம் / Office: 055-2222202 |
| E-mail: governoruva@sltnet.lk governoruva@gmail.com | E-mail: secgoup@sltnet.lk secgoup@gmail.com | Web: www.governor.up.gov.lk | |

08 NOV 2017

පැහැබර ඌවක්

ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
**Uva Provincial Council**

**Ministry of Finance & Planning, Law &Peace, Education, Local Government,Land, Power & Energy, Construction andRural Infrastructure Development**

கிங்வீதி - பதுளை **King Street - Badulla**

| | | |
|---|---|---|
| ඔබේ අංකය / உமது இலக்கம் / Your No | මගේ අංකය / எனது இலக்கம் / My No: 9/ඩී/1/4/17 | දිනය / திகதி / Date: 2017.11. 07 |

අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
ඌව පළාත් සභාව,
බදුල්ල.

**<u>වැලිමඩ බ/මැටිවලලන්ද විදුහලේ පවතින මූල්‍යමය ගැටළු සම්බන්ධවයි.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් වැලිමඩ, බ/මැටිවලලන්ද විදුහලේ 2017/10/17දින සිදුකරන ලද විමර්ශනය හා සම්බන්ධවයි.

2. එම විමර්ශනයේදී අදාල පාසලේ විදුහල්පතිතුමාගේ පරිපාලනයේ ඇතැම් දුර්වලතා හා පාසල් සංවර්ධන සමිතියේ ගණුදෙණු පිළිබඳව ගැටලු සහගත තත්වයක් පවතින බව අනාවරණය වී ඇත. (අදාල විමර්ශන වාර්තාවේ පිටපතක් මේ සමඟ ඔබ වෙත ඉදිරිපත් කරමි.)

3. ඒ අනුව අදාල විමර්ශන වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔබ දෙපාර්තමේන්තුව මඟින් විගණනයක් සිදුකර මා වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

4. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජී. ඒ.එම්. එස්. පී. අබන්වල
ලේකම්

සතුට, සුවය හා ආරක්ෂාව සපිරි දරු පරපුරක් ඌව පළාත තුළ ඇති කිරීම
மகிழ்ச்சியான, ஆரோக்கியமான மற்றும் பாதுகாப்பான ஊவாவின் சிறுவர்கள்
Happy, Healthy & Safe Children of Uva

ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
UVA PROVINCIAL COUNCIL

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
நன்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்பு சேவைகள் திணைக்களம்
Department of Probation and Child Care Services

ආර්.එච්. ගුණවර්ධන මාවත, බදුල්ල. ஆர். எச். குணவர்தன மாவத்தை, பதுளை R.H. Gunawardana Mawatha, Badulla.

මගේ අංකය / என் இல / My No: ඌව/පරි/ආ/1/2/15
ඔබේ අංකය / உம் இல / Your No:
දිනය / திகதி / Date: 2018.08.16

"1818 ඌව වෙල්ලස්ස නිදහස් අරගලයේ 200 වන අභිමානවත් සැමරුමට පෙළ ගැසෙමු"

අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
ඌව පළාත් සභාව,
බදුල්ල.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ඌව පළාත් සභාව
17 AUG 2018

**<u>කතරගම නැණ සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානය සම්බන්ධව</u>**
**<u>විශේෂ විමර්ශනයක් පැවැත්වීම</u>**

මෙම දෙපාර්තමේන්තුවට අයත් කතරගම නැණ සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ දෛනික කටයුතු පරීක්ෂා කරනු ලබන අවස්ථාවේදී එහි කාර්යය මණ්ඩලය විසින් නේවාසික දරුවන්ට වද හිංසා දෙමින් දරුවන් පීඩාවට පත් කරනු ලබන බවට කරුණු අනාවරණය විය.

02. එබැවින් මෙම ආයතනය සම්බන්ධව අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩය මගින් විශේෂ විමර්ශනයක් සිදුකර දෙන ලෙසත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යැවීමට හැකිවන පරිදි ඒ පිළිබඳව වාර්තාවක් ලබාදෙන ලෙසත් කාරුණිකව ඉල්ලමි.

පී.ඩබ්.සී.එස්.ප්‍රියභාෂිණී
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්
ඌව පළාත

නැඟැබර ඌවක්

ඌව පළාත් සභාව

ஊவா மாகாண சபை

Uva Provincial Council

මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

நிதியும் திட்டமிடலும், சட்டமும் சமாதானமும், கல்வி, மாகாண உள்ளூராட்சி, காணி, மின்சக்தியும் வலுசக்தியும், நிர்மாணத்துறை, கிராமிய உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு

Ministry of Finance & Planning, Law & Peace, Education, Local Government, Land, Power & Energy, Construction and Rural Infrastructure Development

රජ වීදිය - බදුල්ල

இராஜவீதி - பதுளை

King Street – Badulla

ඔබේ අංකය / உமது இலக்கம் / Your No

මගේ අංකය / எனது இலக்கம் / My No – 9/ර/3/2/14

දිනය / திகதி / Date – 2018.06.18

අධ්‍යක්ෂ,

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,

ඌව පළාත් සභාව.

12 JUN 20

**අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම.**

**මො/අළුපොත මුස්ලිම් විද්‍යාලය.**

විදුහල් මා පිය සංගමය නමින් මො/අළුපොත මුස්ලිම් විදුහල සම්බන්ධයෙන් ජනාධිපති විමර්ශන ඒකකය වෙත ඉදිරිපත් කරන ලද ලිපියකට අනුව මෙම අමාත්‍යාංශයේ විමර්ශන අංශයේ නිළධාරීන් විසින් අදාළ පාසල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන ලදි.

අදාළ වාර්තාවට අනුව පාසලේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් වාර්තා කර ඇත.

එම වාර්තාවේ පිටපතක් මේ සමග ඔබ වෙත ඉදිරිපත් කරන අතර මෙම පාසල සම්බන්ධයෙන් විගණනයක් සිදු කර ඔබගේ නිර්දේශ ඇතුලත් වාර්තාවක් මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

(ජී.ඒ.එම්.එස්.පී.අඹන්වල)

ලේකම්

04 JUL 2018

ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
UVA PROVINCIAL COUNCIL

සෞඛ්‍ය , දේශීය වෛද්‍ය , පරිවාස හා ළමාරක්ෂක ,වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය
சுகாதார . சுதேச வைத்திய . நன்னடத்தை சிறுவர் பராமரிப்பு மற்றும் மகளிர் விவகார, rKfeyd,Gup mikr;R
Ministry Of Health , Indigenous Medicine , Probation and Child care, Women Affairs and Social Welfare

ආර්.එච්. ගුණවර්ධන මාවත , බදුල්ල.
R.H. Gunawardana Mawatha ,
Badulla.

මගේ අංකය
எனது இல
My No 5/AC/FA/IA/2017/08

ඔබේ අංකය
உமது இல
Your No ---------------------------

දිනය
திகதி
Date 2018.07. ෆ෩

අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
ඌව පළාත් සභාව.
බදුල්ල.

**<u>අභ්‍යන්තර විගණන පරීක්ෂණය-2017</u>**
**<u>මූලික රෝහල-බිබිල</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා අමතන ලද ඔබේ අංක අවි/20/2017/17/290 හා 2017.11.17 දිනැති විගණන විමසුම හා බැදේ.

02.ඒ අනුව, එම විගණන විමසුමේ සඳහන් පොදු නිරීක්ෂණ හා යෝජනා සම්බන්ධයෙන් ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මා වෙත යොමු කරන ලද අංක UH/FI/IAQ/36/2017 හා 2018.06.29 දිනැති පිළිතුරු වාර්තාව මේ සමග කාරුණිකව ඉදිරිපත් කරන අතර එහි සඳහන් කරුනු සම්බන්ධයෙන් විගණනයේ එකඟතාවය මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අඩුපාඩු නිවැරදි කිරීම සම්බන්ධයෙන් නැවත පරීක්ෂා කර බැලීමට ද යෝජනා කරමි.

එල්.එල්.අනිල් විජේසිරි.
ලේකම්.

පිටපත් 01. ඌව පළාතේ ප්‍රධාන ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
02. ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්, - කාරුණික දැන ගැනීම සඳහා
03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) - කාරුණික දැනගැනීම සඳහා
04. සහකාර විගණකාධිපති. - කාරුණික දැන ගැනීම සඳහා

ලියාපදිංචි තැපෑලෙනි / හැබර උංවක්

ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
**Uva Provincial Council**

මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

Ministry of Finance & Planning, Law &Peace, Education, Local Government, Land, Power & Energy, Construction and Rural Infrastructure Development

King Street - Badulla

Your No:

My No: 9/ශි/13/1/11

Date: 2017.12.11

ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ ,
ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ,
ඌව පළාත් සභාව,
බදුල්ල.

**<u>ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ප්‍රධාන ගබඩාව -කිණිගම</u>**
**<u>විශේෂ පරීක්ෂණය -2017</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක අවි/19/2017/24/300 හා 2017.11.24 දිනැති වාර්තාව සම්බන්ධවයි.

02.එම වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් 2017.12.07 වන දින මවිසින් විශේෂ පරීක්ෂණයක් සිදුකල අතර එහිදී එම කරුණු නිවැරදි බව තහවුරු විය.

03.ඒ අනුව "දරුවන් සුරකිමු" තිරසාර පාසල් පොත් බෙදාදීමේ ජාතික වැඩසටහනට සමගාමීව මෙම අමාත්‍යාංශය විසින් මිලදී ගත් පොත් 7595ක් පමණ ඉතිරිව ඇති බව තහවුරු විය.එම පොත් මෙම වර්ෂය තුළ බෙදා අවසන් කිරීමට වැඩසටහනක් සකස් කල බව කාරුණිකව දන්වා සිටිමි.

04.ඒ අනුව ඔබ විසින් මෙම කරුණු සම්බන්ධයෙන් මා දැනුවත් කිරීම සම්බන්ධව මාගේ කෘතඥවේදී ස්තූතිය මෙයින් පළකර සිටිමි.

ජී.ඒ.එම්.එස්.පී අඹන්වල
ලේකම

පිටපත -: ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - දැනට ගබඩාවේ ඇති පොත්පත් , උපකරණ හා බඩුබාහිරාදිය විධිමත් පරිදි බෙදා අවසන් කිරීම සඳහා

ලේකම් / Secretary 055-2222801 | 055-2222820 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / Senior Asst. Secretary 055-3012940 | සහකාර ලේකම් (පාලන) / Asst. Secretary (administrative) 055-2231909
055-2229970 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) 055-2229686 | පරිපාලන නිලධාරී

# අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරීන් යොමු කිරීම

- දෙපාර්තමේන්තුව වෙත නිලධාරීන් යොමු කිරීමේදී වෘත්තීමය වශයෙන් විගණන කටයුතු සඳහා පළපුරුදු, දක්ෂ, විධිමත් පුහුණුව ලැබූ නිලධාරීන් අනුයුක්ත කර ගැනීම ගැටළු සහගත තත්ත්වයකි. මෙහිදී සමහර නිලධාරීන් සැලකිය යුතු මට්ටමේ හැකියාවක් තිබුණත් සමහර නිලධාරීන්ගේ හැකියාව අඩු මට්ටමක දක්නට ඇත.

- මෙවැනි අවස්ථා වලදී ආයතන වල රාජකාරී මෙන්ම කාර්යභාරය අනුව නිලධාරීන් විගණන කටයුතු සඳහා යොමු කරනු ලබයි.

- එසේම 2015 වර්ෂය සිට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සඳහා විගණන නිලධාරීන්ගේ සැලකිය යුතු මට්ටමේ පුරප්පාඩු පවතී. මේ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රධාන ලේකම්තුමන්ගේ අවධානය යොමු වී මේ වන විට අදාළ අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු සිදුවෙමින් පවතී.

- කෙසේ නමුත් සිටින නිලධාරීන්ගෙන් උපරිම මට්ටමේ කාර්ය සාධනයකින් විගණන කටයුතු සිදු කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. ඒ සඳහා නිලධාරීන්ගේ දායකත්වයද නිරන්තරයෙන් ලැබේ.

- එසේම විගණන කටයුතු සහ විගණන වාර්තා පිළිබඳ අදහස් දැක්වීමේ කුඩා ආයතනයක් පිළිබඳ නිකුත් කරන විගණන වාර්තාවක් සහ සැලකිය යුතු රාජකාරී ප්‍රමාණයක් ඇති ප්‍රධාන කාර්යාලයක විගණන වාර්තාවක ගුණාත්මක භාවය මෙන්ම අඩංගු වන කරුණු බොහෝ දුරට වෙනස් ආකාරයකින් ඉදිරිපත් වනු ලබයි.

නමුත් ආයතන දෙක පිළිබඳ අවධානය යොමු කිරීමේදී එම තත්ත්වයන් සලකා බැලිය යුතු තත්ත්වයන් වේ.

උදා :-

**01.** පේෂකර්ම මධ්‍යස්ථානයක පවතින නූල් තොගයක යම් අඩුපාඩුවක් නිරීක්ෂණය වේ. ඒ සඳහා හේතු වශයෙන් එය සුළු ප්‍රමාණයක් බැවින් විධිමත් පරිදි ගබඩා කිරීමට නොහැකි වූ බව දැක්වීම.

**02.** පාසලක පැමිණීමේ ලේඛනය සුළු අඩුපාඩු පෙන්වා දුන් අවස්ථා ඇත. මෙහිදී ගුරුභවතුන්ගේ පැමිණීම අධ්‍යාපන කටයුතු සඳහා සෘජුවම බලපෑම් කරන බැවින් ඒ බව විගණන වාර්තාවේ සඳහන් කරයි. මේ සඳහා හේතු වශයෙන් සඳහන් කරන්නේ එවැනි අඩුපාඩුවක් සිදුවී නොමැති බවය. ඒ පිළිබඳ නැවත සොයා බැලීමේදී නිරීක්ෂණය වන්නේ අදාළ පැමිණීමේ ලේඛනයේ පිටුව ඉවත් කර නව පැමිණීම් පිටුවක් අමුණා ඇති බවය. මෙවැනි පාසලක මනා පරිපාලනයක් තිබේද, අධ්‍යාපන සංවර්ධනයක් බලාපොරොත්තු විය හැකිද යන්න විමසා බැලිය යුතුය.

- සමහර ආයතන පද්ධති වල ආයතන පරිපාලන කටයුතු ගැටළු සහගත නොවූවද මූල්‍ය පාලනය ගැටළු සහගත වේ. එසේම මූල්‍ය පාලනය ගැටළු නොවන විටදී කාර්ය සාධනය ගැටළු සහගත වේ. මෙවැනි අවස්ථා වල කළමනාකරණයට ප්‍රයෝගිකව අනුගත විය හැකි පරිදි සහ සමස්ථ පද්ධතියෙන්ම තීරණ ගත හැකි පරිදි කොටස් වශයෙන් විගණන වාර්තා නිකුත් කිරීමක් වර්තමානයේ සිදු කරනු ලැබේ.

## විගණන විමසුමක් නිකුත් කල පසු ඒ සඳහා කරුණු ඉදිරිපත් කිරීම, සාකච්ඡා කිරීමට කටයුතු කල හැක.

**01.** විගණන සාකච්ඡා පැවැත්වීම.

**02.** විගණන හා කළමනාකරණ කමිටු වලදී සාකච්ඡා කිරීම.

**03.** ලිඛිත පිළිතුරු ලබාදී එකඟතාවය ලබාගැනීම.

**04.** ලිඛිතව විගණන විමසුම් සම්බන්ධයෙන් එකඟතාවය ලබා ගැනීම.

**05.** ප්‍රගති සමාලෝචන සාකච්ඡා වලදී අදහස් ප්‍රකාශ කිරීම.

මෙම වර්ෂයේ ඉලක්කගත වැඩසටහනට අනුකූලව අභ්‍යන්තර විගණනයේ ක්‍රියාත්මක වීම.

# පළාත් සභා පරිපාලනයට යටත් ආයතන

## ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

| ආයතනය | ආයතන ගණන |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | 01 |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාල | 10 |
| කොට්ඨාස අධ්‍යාපන කාර්යාල | 24 |
| පාසල් | 809 |
| සංචාරක බංගලා | 01 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 01 |
| සහකාර පළාත් පාලන දෙපාර්තමේන්තු | 02 |
| මහ නගර සභා | 02 |
| නගර සභා | 01 |
| ප්‍රාදේශීය සභා | 25 |
| ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 01 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල (ඉඩම් කටයුතු) | 26 |
| ඌව පළාත් මුද්‍රණාලය | 01 |
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 01 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල (ග්‍රාම සංවර්ධන කටයුතු) | 26 |
| ග්‍රාමීය කාන්තා අභිවෘධි මධ්‍යස්ථාන | 28 |
| පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 01 |
| ඌව ප්‍රජා ගුවන් විදුලිය | 01 |
| පුස්තකාල සේවා මණ්ඩලය | 01 |
| එකතුව | 963 |
| 2018 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව හා මුළු ආයතන ගණන අනුව එහි ප්‍රතිශතය | 134 (13.91%) |

# ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිශ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| ආයතනය | ආයතන ගණන |
|---|---|
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 01 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 |
| නියෝජ්‍ය කෘෂිකර්ම දෙපාර්තමේන්තු | 02 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල | 07 |
| පුහුණු ආයතන/ගොවිපල | 04 |
| සංචාරක බංගලා | 01 |
| කෘෂි උපදේශක කාර්යාල | 47 |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 01 |
| නියෝජ්‍ය පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු | 02 |
| පශු වෛද්‍ය කාර්යාල | 28 |
| වාරි මාර්ග දෙපාර්තමේන්තුව | 01 |
| වාරි මාර්ග ඉංජිනේරු කාර්යාල | 02 |
| එකතුව | 97 |
| 2018 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව හා මුළු ආයතන ගණන අනුව එහි ප්‍රතිශතය | 22 (22.68%) |

# මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමූපකාර කටයුතු අමාත්‍යාංශය

| ආයතනය | ආයතන ගණන |
|---|---|
| මාර්ග අමාත්‍යාංශය | 01 |
| මාර්ග දෙපාර්තමේන්තුව | 01 |
| මාර්ග ඉංජිනේරු කාර්යාල | 06 |
| සමුපකාර දෙපාර්තමේන්තුව | 01 |
| සමුපකාර සේවා කොමිෂන් සභාව | 01 |
| සමුපකාර උප කොමසාරිස් කාර්යාල | 02 |
| එකතුව | 12 |
| 2018 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව හා මුළු ආයතන ගණන අනුව එහි ප්‍රතිශතය | 07 (58.33%) |

# ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

| ආයතනය | ආයතන ගණන |
|---|---|
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 01 |
| සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 01 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල | 02 |
| රෝහල් | 63 |
| මධ්‍යම බෙහෙත් ශාලා | 27 |
| සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල | 27 |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| ආයුර්වෙද රෝහල් | 06 |
| ඖෂධ නිෂ්පාදනාගාර | 01 |
| ආයුර්වෙද මධ්‍යම බෙහෙත් ශාලා | 24 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 01 |
| පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 01 |
| පරිවාස කාර්යාල | 05 |
| සහතික කළ පාසල් /ළමා නිවාස/රැඳවුම් මධ්‍යස්ථාන | 06 |
| එකතුව | 166 |
| 2018 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව හා මුළු ආයතන ගණන අනුව එහි ප්‍රතිශතය | 52 (31.32%) |

# ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත පිළිබඳ අමාත්‍යාංශය

| ආයතනය | ආයතන ගණන |
|---|---|
| ක්‍රීඩා අමාත්‍යාංශය | 01 |
| ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 01 |
| දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරි කාර්යාල | 02 |
| ක්‍රීඩා පුහුණු පාසල් | 01 |
| ප්‍රවාහන සේවා අධිකාරිය | 01 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 01 |
| වඩු පුහුණු පාසල් | 09 |
| පේෂකර්මාන්ත මධ්‍යස්ථාන | 57 |
| වේවැල්/රතු මැටි/කොහු/ලුහු ඉංජිනේරු/මැහුම් මධ්‍යස්ථාන | 06 |
| ජනකලා කේන්ද්‍රය | 01 |
| ඌව පළාත් කෞතුකාගාරය | 01 |
| සංචාරක දෙපාර්තමේන්තුව | 01 |
| එකතුව | 82 |
| 2018 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව හා මුළු ආයතන ගණන අනුව එහි ප්‍රතිශතය | 28 (34.14%) |

# අමාත්‍යංශ යටතට නොගැනෙන ආයතන

| ආයතනය | ආයතන ගණන | 2018 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව හා මුළු ආයතන ගණන අනුව එහි ප්‍රතිශතය |
|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)<br>- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලය<br>- ප්‍රාදේශීය ලේකම් කාර්යාල (මූල්‍ය කටයුතු) | 01<br>26 | 25 (92.59%) |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)<br>- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය<br>- කහගොල්ල පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය<br>- පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>- ගොඩනැගිලි ඉංජිනේරු කාර්යාල | 01<br>01<br>01<br>04 | 12 (171.42%) |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br>- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය<br>- පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානය<br>- ඔහිය පුහුණු මධ්‍යස්ථානය | 01<br>01<br>01 | 03 (100%) |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය | 01 | 01 (100%) |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) කාර්යාලය | 01 | 02 (200%) |
| ආණ්ඩුකාරවර කාර්යාලය | 01 | 02 (200%) |
| සභා ලේකම් කාර්යාලය | 01 | 2018 සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මස විගණන වැඩසටහන් වලට ඇතුළත් කර ඇත. |
| රාජ්‍ය සේවා කමිෂන් සභාව | 01 | |
| සමුපකාර සේවක කමිෂන් සභාව | 01 | |

මේ අනුව මෙම කරුණු ඉදිරිපත් කිරීම තුළින් විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාවලියේ මෙන්ම අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ යම් සංශෝධන හෝ වැඩිදියුණු කිරීම් සඳහා ඔබ සියලු දෙනාගේ අදහස් ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර මෙම සාකච්ඡාව සඳහා විවෘතව සක්‍රීයව සම්බන්ධ වන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

# ස්තූතියි..!